**ගාල්ල මහා නගර සභාව - 2022**
---------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 අභිතකර මතය**

ගාල්ල මහා නගර සභාව 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත් බව හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට ගාල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 අභිතකර මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අභිතකර මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අභිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය

සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගෙන තිබුණු රු.4,425,592 ක් වටිනා ගබඩා ද්‍රව්‍ය තොග පාලන ගිණුමට සහ ගබඩා ණයහිමි ගිණුමට ගිණුම් ගතකර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. |
| (ආ) | විවිධ කාර්යයන් සඳහා සභාවේ පොදු ගබඩාවෙන් නිකුත් කර තිබූ රු.327,031 ක් වටිනා ද්‍රව්‍ය ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබුණු හිඟ ආදායම රු.36,010,184 ක් ප්‍රවර්ථන වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | - එම - | - එම - |
| (ඈ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු කර්මාන්ත බදු රු.374,250 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට ඉටු කරන ලද වැඩ කොටස් නිශ්චිතව හඳුනා ගැනීමකින් තොරව කර්මාන්ත ඉදිකිරීම් 15 ක් වෙනුවෙන් රු.17,624,788 ක් කර්මාන්ත ණයහිමි ප්‍රතිපාදන වෙන් කර තිබුණි. | 2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන සලස්වා ඇති බව. | - එම - |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දී පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු එකතු වටිනාකම රු.10,461,330 ක් වූ යන්ත්‍ර 02 ක් ගිණුම් ගත කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | - එම - |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු.9,991,255 ක පුනරාවර්තන වියදම් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | - එම - | - එම - |
| (ඌ) | අය කරන ලද රු.11,001,976 ක ආපසු නොගෙවන ආවරණ අනුමත දඩ මුදල් ආදායමට ගැලපීම් නොකර, ගෙවිය යුතු තැන්පතු ලෙස ගිණුම් ගතකර තිබුණි. | - එම - | - එම - |

| | | | |
|---|---|---|---|
| (එ) | සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගෙන තිබුණු වටිනාකම රු.4,563,030 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනීත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය මුදල වූ රු.2,470,914 ක මුදල අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | දේශීය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු හිඟ පොලිය බව. | - එම - |
| (ඔ) | සමාලෝචිත වර්ෂයට අදාළ රු.2,091,800 ක් වූ උසාවි දඩ සහ රු.3,271,000 ක් වූ මුද්දර ගාස්තු බිල් කිරීම් ගිණුම් ගතකර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | - එම - |
| (ඕ) | සමාලෝචිත වර්ෂයේ 2022 දෙසැම්බර් 31 දින දක්වා ගෙවිය යුතු රු.109,486,708 ක විශ්‍රාම වැටුප් දායකය ගිණුම් ගතකර නොතිබුණි. | - එම - | - එම - |
| (ක) | සභාවට අයත් එකතු පිරිවැය රු.4,584,070 ක් වූ වාහන 18 ක් වෙන්දේසි කර විකුණා තිබූ නමුත් එහි වටිනාකම ස්ථාවර වත්කම් ගිණුමෙන් ඉවත් කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. |
| (ග) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවල් කුලී මුදල් ගිණුම සහ ගෙවල් කුලී තැන්පතු ගිණුමේ ශේෂය අතර රු.2,753,908 ක වෙනසක් නිරීක්ෂණය විය. | ශේෂ අතර වෙනස තහවුරු කර ගැනීමට කටයුතු කරන බව. | - එම - |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 16 කට අදාළ ශේෂයන් සහ ඊට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.277,697,350 ක වෙනසක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතු වේ. |

### 1.6.3 අවිනිශ්චිත ගිණුම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 වර්ෂයේ සිට පැවත එන රු.111,553 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ඉදිරි කටයුතු සිදු කරන බව. | ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.930,426,450 ක් වූ ගිණුම් විෂයයන් 13 ක් තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | සාක්ෂි ඉදිරිපත් කිරීමට නොහැකි බව. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

### 1.7 අනුකූල නොවීම්

**රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පළාත් සභා මූල්‍ය රීති 476 හා 477 | සභාව සතු සියලුම වාහන සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මඟින් ඉටු කිරීමට කටයුතු කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | සමාලෝචිත වර්ෂය අවසානයට රු.3,309,144 ක් වටිනා කල් ඉකුත් වූ තැන්පතු නියාදනය කර නොතිබුණි. | ආදායමට ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.66,596,685 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.253,560,459 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.253,942 ක් වටිනා චෙක්පත් 15 ක් අගරු වී වසර 3ත්, වසර 24 ත් අතර කාලයක් ගත වී තිබුණ ද, සභාව විසින් ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 1993 නොවැම්බර් 13 දිනැති නාගරික සංවර්ධන අධිකාරි සැලසුම් චක්‍රලේඛ අංක 15 ප්‍රකාරව ඉතිරිකිරීම් ගිණුමේ පැවති රු.16,832,559 ක ශේෂය ප්‍රයෝජනයට ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සභාව විසින් ඉදිරිපත් කර නොතිබුණි. | හියාරේ ජලාශය කේන්ද්‍ර කොට ගෙන සංවර්ධනය ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට නියමිත බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කල තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස් කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තුගත ආදායම | 2021 බිල් කළ ආදායම | 2021 රැස් කළ ආදායම | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 112,500,000 | 113,645,131 | 88,558,593 | 230,704,649 | 101,200,000 | 104,905,650 | 69,204,375 | 205,618,111 |
| කුලී | 117,882,000 | 58,438,908 | 61,189,509 | 41,964,452 | 118,631,000 | 38,685,461 | 41,238,426 | 44,715,053 |
| බලපත්‍ර ගාස්තු | 33,958,000 | 26,842,014 | 24,761,694 | 7,670,591 | 40,104,000 | 18,797,608 | 20,469,568 | 5,590,271 |
| වෙනත් ආදායම් | 56,596,000 | 131,758,201 | 129,375,318 | 5,328,202 | 49,988,000 | 287,661,249 | 285,984120 | 2,945,319 |
| | 320,936,000 | 330,684,254 | 303,885,114 | 285,667,894 | 309,923,000 | 450,049,968 | 416,896,489 | 258,868,754 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම රැස් කිරීම් කාර්යසාධනයට සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂය ආරම්භයේ වූ රු.178,343,608 ක වරිපනම් හිඟය වර්ෂය අවසානය වන විට රු.195,495,805 ක් දක්වා රු.17,152,197 කින් වැඩි වී තිබුණි. ඉන් හිඟ හිටි ආදායම රු.100,000 ක් ඉක්ම වූ දේපල 188 කින් රු.53,223,202 ක් ද, රු.500,000 ක් ඉක්ම වූ දේපල 31 කින් රු.26,128,860 ක හිඟ ශේෂයක් අයවීමට තිබුණි. | අයකර ගැනීමට දේපළ හිමියන් වෙත දැන්වීම් සිදුකර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. |
| (ආ) | 2013 වර්ෂයෙන් පසු නව වාර්ෂික වටිනාකම් මත වරිපනම් අය කිරීම සඳහා දේපළ වටිනාකම් ප්‍රතිශෝධනයක් සිදු කර නොතිබුණි. | ඉදිරියේ දී කටයුතු කරන බව. | පනත ප්‍රකාව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට මුළු හිඟ කුලී ආදායම රු.44,715,053 ක් වූ අතර, වර්ෂයේ අවසානයට රු.41,964,452 ක හිඟ ශේෂයක් විය. | මහා නගර සභා ආඥා පනතේ 266 වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සභාව සතුව වෙළෙඳ පරිශ්‍ර 15 ට අදාළව කඩ කාමර 637 ක් පැවති අතර, 2022 දෙසැම්බර් 31 දින වන විට හිඟ කඩ බදු කුලිය රු.20,094,237 ක් වුවද, මහා නගර සභා ආඥා පනතේ 253(1) වගන්තිය ප්‍රකාරව හිඟ කුලිය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඉ) | 2009 වර්ෂයේ සිට ගාල්ල නාගරික මාළු වෙළඳපොළ කඩ කාමර 54 කින් කඩ කාමර 20 ට අදාළව කිසිදු ගිවිසුම්ගත වීමක් හෝ කඩ කුලී අයකර නොතිබුණු අතර, 2021 වර්ෂයේ දී රු.4,057,080 ක මුදලක් දරා උක්ත කඩ කාමර 34 ක් නවීකරණය කර තිබුණි. | ඉදිරියේදී ටෙන්ඩර් කිරීමට නියමිත බව. | කඩකාමර බදුදීමට කටයුතු කළ යුතු වේ. |
| (ඊ) | ගාල්ල මධ්‍යම බස් නැවතුම්පොල කඩ කාමර 20 ට අදාළව තක්සේරුව අනුව අයවිය යුතු කඩ කුලී රු.7,082,990 ක් මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 266 අ වගන්තියට පටහැනිව කපා හැර තිබුණි. | ඉදිරියේ දී අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ බලපත්‍ර ගාස්තු ආදායම රු.5,590,271 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට එය රු.7,670,591 ක් විය. | අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතු වේ. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ වෙනත් ආදායම රු.2,945,319 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට එය රු.5,328,202 ක් විය. | නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | - එම - |
| (එ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.184,448,164 ක් ලැබිය යුතුව තිබුණි. | අදහස් දක්වා නොමැත. | හිඟ ආදායම් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රුපියල් මිලියන 220 ක කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කළහැකි කවම්මා කොම්පෝස්ට් ව්‍යාපෘතිය ලැබී තිබුණ ද, යටිතල පහසුකම් සංවර්ධනය නොවීමෙන් මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමට නොහැකි වී තිබුණි. | අදාළ ඇස්තමේන්තු පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇති බව. | අවශ්‍ය යටිතල පහසුකම් සපයා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමට නියමිත කාලය තුළ ඉටු නොකිරීමෙන් නාගරික මුදල් දෙපාර්තමේන්තුවේ වැය අංශය රු.60,000 ක මාසික කුලී පදනම මත වෙනත් ස්ථානයක ස්ථානගත කිරීම නිසා රු.3,600,000 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. | අළුත්වැඩියා කටයුතු සිදු කරන බව. | නිශ්චිත කාල රාමුවක් අනුව කටයුතු කළ යුතු වේ. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.994,900 ක් වටිනා ලැප්ටොප් 11 ක් හා රු.395,991 ක් වටිනා ටැබ් 09 ක් සභිකයින්ට ලබාදී තිබුණ ද නැවත භාර දී නොතිබුණි. | සිහි කැඳවීම් ලිපියොමු කර ඇති බව. | සභාව සතු වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | නාගරික කර්මාන්ත ශාලාවේ ඉදිකිරීම් කටයුතු නියමිත පරිදි නිම කරවා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් රථ වාහන අළුත්වැඩියා හා සේවා කිරීම සඳහා පෞද්ගලික අංශය වෙත රු.12,342,335 ක මුදලක් ගෙවා තිබුණි. | ඉදිරියේදී අළුත්වැඩියා කිරිමට අපේක්ෂිත බව. | ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කළ යුතු වේ. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෙඩ්ලර් වීදිය පොදු සේවා නිවාසයක් 2015 ඔක්තෝබර් 01 වන දින සිට අවුරුදු 30 කට එක්තරා පෞද්ගලික සමාගමකට බදු දී තිබුණු අතර සභාවට අය විය යුතු කුලී අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව. | හිඟ කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | වසර 30 කට පෙර ගාලු සිරි උයන ඉඩම වෙන්දේසි කර සභාවට පොදු කටයුතු සඳහා ලබාදී තිබූ අක්කර 01 පර්චස් 12.35 ක ඉඩම පොදු කටයුතු සඳහා යොදා ගෙන නොතිබුණු අතර, ඉඩමේ පර්චස් 10.5 ක කොටසක පුද්ගලයකු අනවසරයෙන් පදිංචි වී තිබුණි. | ස්ථානීය පරීක්ෂණයක් සිදු කර වාර්තාව ඉදිරි කටයුතු සඳහා යොමු කර ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.5 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මහා නගර සභා ආඥා පනත අනුව මාතෘ හා ළමා සංරක්ෂණ කාර්යය සඳහා 2022 වර්ෂයේ දී රු.21,621,000 ක් වෙන්කර තිබුණු නමුත්, සභාව විසින් එම කාර්යය ඉටුකර නොතිබුණි. තවද මහා නගර සභා පරිශ්‍රය තුළ සායන මධ්‍යස්ථානයක් ඇතුළු සායන මධ්‍යස්ථාන 11 ක කටයුතු ක්‍රියාත්මක නොවීමෙන් මෙම සායන මධ්‍යස්ථාන ගොඩනැගිලි නිෂ්ක්‍රීයව පැවතුණි. | සායන මධ්‍යස්ථානය වසා තිබෙන බව. | සභාව සතු වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) ගාල්ල මහා නගර සභාව සතු ඉඩම් 132 න් ඉඩම් ලේඛනයට ඇතුළත් කර තිබුනේ ඉඩම් 24 ක් පමණි. ඉඩම්වල භෞතික පිහිටීම හඳුනා ගැනීමට නොහැකි වූ අතර ඉන් ඉඩම් 11 ක් අනවසරයෙන් අල්ලා ගෙන තිබුණු බව අනාවරණය විය. | භෞතික පිහිටීම හඳුනා ගැනීම සිදු කර අනවසරයෙන් අල්ලා ගැනීම පිළිබඳව කටයුතු කරන බව සහ ඉඩම් මැන නිරවුල් කර, වැට මායිම් ස්ථාපනයට කටයුතු කරන බව. | සභාව සතු වත්කම් හඳුනා ගෙන ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) ගාල්ල මහා නගර සභාවට අයත් පොදු සේවා නිවාස 03 ක් අළුත්වැඩියා කර භාවිතයට ගෙන නොතිබුණි. | ඉදිරියේ දී අළුත්වැඩියා කරන බව. | සභාව සතු වත්කම් ප්‍රයෝජනයට ගැනීමට සහ ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3.6 ව්‍යාපෘති කර්තව්‍යයන් හා ප්‍රාග්ධන වැඩ ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රු.5,000,000 ක ඇස්තමේන්තු පිරිවැයට 2021 වර්ෂයේ ගිවිසුම් ගත වී තිබූ ගාල්ල මිලිද්දුව ඇත්තිලිගොඩ ක්‍රීඩාපිටිය අළුත්වැඩියා කිරීමේ කර්මාන්තය සම්පූර්ණ නොකර, අතරමග නතර කර තිබුණි. අදාළ කර්මාන්තය 2022 මාර්තු 06 දින නිම කලයුතු වුවද, නියමිත වේලාවට කර්මාන්තය ඉටු නොකිරීම නිසා ප්‍රදේශවාසීන්ට අදාළ ප්‍රතිලාභ ලබා ගැනීමේ අවස්ථාව ද අහිමි වී තිබුණි. | කර්මාන්තයේ තිබූ ගැටළුකාරී තත්ත්වයක් නිසා ගෙවීම් සිදු කර නොමැති බව. | ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වේ. |
| (ආ) දඩැල්ල මැහුම් මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීම සඳහා 2020 වර්ෂයේ සකස් කරන ලද රු.420,000 ක ඇස්තමේන්තුව වගකිවයුතු පාර්ශවය විසින් ක්‍රියාත්මක නොකර, අතහැර දමා තිබීම හේතුවෙන් | අළුත්වැඩියාව ඉටු කිරීමට කටයුතු කරන බව. | සභාව සතු වත්කම් කළමනාකරණය කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| රු.1,732,000 ක ඇස්තමේන්තුවක් නැවත සකස් කර තිබුණි. එය ක්‍රියාත්මක නොකිරීමෙන් දඩැල්ල ප්‍රදේශවාසීන්ට එම සේවාව ලැබී නොතිබුණු අතර, එම මැහුම් මධ්‍යස්ථානය විනාශ වීමේ තත්ත්වයක් නිරීක්ෂණය විය. | | |

### 3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොන්ත්‍රාත්කරු සමඟ ඇතිකර ගත් ගිවිසුම් අනුව කර්මාන්ත 05 කට අදාළව පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දී තිබුණු 2022 සැප්තැම්බර් මිල අනුපාත භාවිතා කළ යුතු වුවද එම මිල අනුපාත භාවිතා නොකිරීම නිසා රු.1,152,153 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | වැඩිපුර ගෙවීම් අය කළ යුතු වේ. |

### 3.8 මානව සම්පත් කළමනාකරණය

| | | |
|---|---|---|
| (අ) සේවකයින් 43 දෙනෙකුගේ අය විය යුතු එකතුව රු.3,139,430 ක් වූ ණය ශේෂය අය නොවී හිඟහිටිව පැවතුණි. ඉන් සේවකයින් 40 දෙනෙකුගේ ණය ශේෂ එකතුව රු.2,670,355 ක් වසරකට වඩා වැඩි කාලයක් තිස්සේ හිඟ හිටිව පැවතුණි. | ශේෂයන් අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගනු ලැබූ බව හා පසු විපරම් කිරීම සිදු කරන බව. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) නගර සභා ආඥා පනතේ 183(1) වගන්තිය ප්‍රකාරව සභාවේ සේවකයින් සඳහා පිහිටුවන ලද සේවක අර්ථසාධක සාමාජික අරමුදල සඳහා 1999 වර්ෂයට පෙර දායක වූ නගර සභා සේවකයින් වෙනුවෙන් එකතු වූ රු.14,500,306 ක් 2022 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණු අතර, එම මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී කරුණු සොයා බැලීම් කර නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 3.9 වාහන පද්ධතිය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වාහන අළුත්වැඩියා කිරීමේ වැඩ ඒකකය අබලන්ව පැවති අතර එම ස්ථානයේ වාහන 26 ක් දීර්ඝකාලීනව අළුත්වැඩියා කිරීමකින් තොරව පැවතුණි. | යාන්ත්‍රික ඉංජිනේරුවරයකු හා මූලික වැඩ පරීක්ෂකවරයෙකු නොමැති වීම හා වැඩ ඒකකය වෙනත් ස්ථානයක ස්ථාපනය කිරීම නිසා බව. | සභාව සතු වත්කම් ප්‍රයෝජනයට ගැනීමට සහ ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ආ) 2020 වර්ෂයේ දී අනතුරට ලක් වූ වාහන 06 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වාහන 04 ට අදාළව රක්ෂණ වන්දි ලබාගෙන නොමැති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රු.199,872,000 ක් ඇස්තමේන්තු කර තිබුණ ද, සංවර්ධන ව්‍යාපෘති සඳහා උපයෝජනය කර තිබුණු වටිනාකම රු.16,690,974 ක් විය. සභාව සතු ස්ථාවර තැන්පතුවල රු.284,884,803 ක මුල්‍ය ප්‍රතිපාදන තිබිය දීත් අයවැයගත සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම් ප්‍රතිශතය සියයට 08 ක් තරම් අඩු අගයක් ගෙන තිබුණි. | නගර ශාලාව නවීකරණ කටයුතු සඳහා මූලික අවධානය යොමුවීම හේතුවෙන් අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රාග්ධන වියදම් උපයෝජනය කිරීම ඉතා අඩුවෙන් සිදු වූ බව. | අයවැය ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |